## විශ්‍රාම/අස්කිරීම් මත ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම උපදෙස් / පිරික්සුම්

### ප්‍රතිපත්ති

- නීත්‍යානුකූලව යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම/අස්ව ගොස් තිබිය යුතුය විශ්‍රාම දිනයෙන් පසුව අයදුම්පත ඉදිරිපත් කල යුතුය.
- බැඳුනු දිනය, විශ්‍රාම ලබන දිනය, නිනොනො කාල සීමාව, නිනොනො දිනය නිවැරදිව සඳහන් කල යුතුය.
- පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජි අංක සහ කාල සීමාවන් (වසර 18 සම්පූර්ණ වීමට ප්‍රථම යුද්ධ හමුදාවට බැඳී නැවත බඳවාගත් අයෙකු නම් පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජි අංක සහ කාල සීමාවන්) සඳහන් කල යුතුය විශ්‍රාමික දිනට පසුව නිශ්කාෂන සහතිකය සමග අයදුම් කල යුතුය.

### කොන්දේසි හා අවශ්‍ය ලිපිලේකන

- ජාතික හැඳුනුම්පතෙහි සහතික කල ජායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- බැංකු පොතේ සහතික කල පැහැදිලි ජායාස්ථ පිටපත (සක්‍රිය ගිණුමක) ඉදිරිපත් කල යුතුය.
- අයදුම්පතෙහි හා ලියකියවිලිවල සඳහන් නමෙහි (මුලකුරු සහිත නම සහ සම්පූර්ණ නම) පරස්පරතාවයක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය සියළු පිටපත් සහතික කල පැහැදිලි පිටපත් විය යුතුය.
- අයදුම්පත අණදෙන නිලධාරි හා මධ්‍යස්ථාන සේනාවිධායක විසින් අත්සන් කර නිල මුද්‍රාව තැබිය යුතුය.
- කර්නල් හා ඉන් ඉහල නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ අයදුම්පත් මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පමණක් අත්සන් කර ඉදිරිපත් කල යුතු අතර ලුතිතන් කර්නල් නිලය සහ ඉන් පහල සියළුම අයවළුන්ගේ අයදුම්පත් අණදෙන නිලධාරිගේ සහතිකයෙන් හා මධ්‍යස්ථාන සේනාවිධායකගේ නිර්දේශයෙන් ඉදිරිපත් කල යුතුය.
- අයදුම්කරු රජයට හෝ යුද්ධ හමුදාවට යම් මුදලක් අයවීමට ඇත්නම් එම මුදල අයකරගත් බැව් නිශ්කාශණයක් ලබාගැනීමෙන් පසු අණදෙන නිළදාරි/මධ්‍යස්ථාන සේනාවිධායක විසින් අත්සන්කල යුතු අතර, එම නිර්දේශයට අනුව අයවීමට කිසිවක් නොමැති සේ සලකා මෙම අම වෙතින් ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි.
- වැහාලේ අම වෙතින් අයකරගත් මුදල් ගෙවීම් සනාථ කිරීමේ ලියකියවිලි (පොදු 176, වැහාලේ අම වව්චර)
- යුආලේ 19/19(අ)/යුආලේ 53 සහතික පිටපත් ඇමිණිය යුතුයි.

### ප්‍රතික්ෂේප වීමට හේතු

- විශ්‍රාමයන දිනට ප්‍රථම අයදුම්පත් ඉදිරිපත් කිරීම.
- අයදුම්පතෙහි සඳහන් විස්තර නිවැරදිව සම්පූර්ණ නොකිරීම.
- අවසන් නිශ්කාශණ සහතිකය (ශාරාංශ වාර්ථාව) ඉදිරිපත් නොකිරීම.
- සුවසහන ණය මුදලෙහි ශේෂය ඉතිරිව තිබීම.
- පුද්ගලික අනන්‍යතාවය පරීක්ෂා කිරීමේදී ජාතික හැඳුනුම්පත හා ගිණුම් විස්තර අනුව නොගැලපීම් සිදුවන අවස්ථාවලදී එහි නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම.
- දැනට යාවත්කාලීන කර ඇති නව අයදුම්පත් වෙනුවට පැරණි අයදුම්පත් ඉදිරිපත්කර තිබීම.
- දැනට අයදුම්කරුගේ යාවත්කාලීනව පවතින ගිණුම් අංකය වෙනුවට පැරණි ගිණුම් අංක අයදුම්පතට ඇතුලත්කර තිබීම.
- නැවත සේවයට බැඳුණු අයෙකු නම් එම දිනය සඳහන් නොකිරීම.
- අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර ඒකක අණ සහතික කර නොමැති අවස්ථාවකදී.
- අයදුම්පත් සමග ඉදිරිපත්කල යුතු අනිකුත් ලියකියවිලි ඒකක අණ සහතික කර නොමැති අවස්ථාවලදී.
- අයදුම්පත සමග ඉදිරිපත් කලයුතු අනිකුත් ලියකියවිලි අමුණා නොමැති අවස්ථාවන්හිදී.
- අයදුම්පත ඉදිරිපත් කරන සාමාජිකයාගේ අත්සන පරස්පර වන අවස්ථාවලදී.